**වැව්ලි කලාපය සඳහා වූ නව ගම්මාන සංවර්ධන අධිකාරියේ ගනුදෙනු පිළිබඳ වාර්තාව - 2019 , 2020 , 2021 හා 2022**

---

වැව්ලි කලාපය සඳහා වූ නව ගම්මාන සංවර්ධන අධිකාරියේ 2019 , 2020 , 2021 හා 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂ සඳහා මෙහෙයුම් කටයුතු පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනත , 1971 අංක 38 දරන මුදල් පනත සහ 2018 අංක 32 දරන වැව්ලි කලාපය සඳහා වූ නව ගම්මාන සංවර්ධන අධිකාරිය පිළිබඳ පනතේ 22 වගන්තියේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළයුතු යැයි මා අදහස් කරන අධිකාරියේ ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් වූ මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

එම පනතේ 16(2) වගන්තිය ප්‍රකාරව, සෑම විගණනය කරනු ලබන අස්ථිත්‍යයක් සම්බන්ධයෙන් වූ වාර්ෂික මූල්‍ය ප්‍රකාශ, රීති මඟින් දක්වනු ලැබිය හැකි පරිදි වන කාලසීමාවක් තුළ එම අස්ථිත්‍යවල වාර්ෂික කාර්ය සාධන වාර්තා ද සමඟ ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා විසින් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතුය.
එම පනතේ 38 (1) (ඇ) වගන්තිය ප්‍රකාරව, වාර්ෂික වාර්තා සහ වෙනත් මූල්‍ය ප්‍රකාශ අවශ්‍ය වේලාවන් ඇතුළත පිළියෙල කිරීමට සිදුවන බව සහතික විය යුතු අතර ඊට අමතරව විගණනය කරනු ලබන අස්ථිත්‍යයට අදාළ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා වගබලා ගනු ලැබිය යුතුය

**1.3 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2003 ජූනි 02 දිනැති අංක පීඊඞී/12 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය ප්‍රකාරව හා 2021 නොවැම්බර් 16 දිනැති 01/2021 චක්‍රලේඛය සමග ඉදිරිපත් කළ මෙහෙයුම් අත්පොතේ ඡේද අංක 6.6 පරිදි ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන සහ කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් 2019, 2020, 2021 හා 2022 යන වර්ෂයන් වල මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තාව 2023 ජනවාරි 15 දින වන විටත් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි. | පිළිගනිමි.<br>කාර්ය මණ්ඩලය නොමැති වීම මත අදාළ කාර්ය ඉටු කිරීමට හැකියාවක් ලැබී නොමැත. 2019, 2020, 2021 වාර්තා මේ වන විට අධ්‍යක්ෂ මණ්ඩල උපදෙස් පරිදි අමාත්‍යාංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණක වෙත යොමු කර නිර්දේශ ලබා ගෙන ඇත. ඒ අනුව විගණකාධිපති වෙත කඩිනමින් ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ. | චක්‍රලේඛය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන සහ කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. |

**1.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම.**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2019 වර්ෂයේ සැප්තැම්බර් හා ඔක්තෝම්බර් යන මාස සඳහා පුද්ගලයෙකු හට මාසිකව රු. 60,000 බැගින් රු. 120,000 ක මුදලක් ගෙවා තිබුණු නමුත් වවුචර් සමඟ කරන ලද කාර්යයන් ඉදිරිපත් කර නොතිබීම නිසා අදාළ ගෙවීමේ නිරවද්‍යතාවය පරීක්ෂා කිරීමට නොහැකි විය. | සහකාර අධ්‍යක්ෂ (ඉදි කිරීම්) සඳහා බඳවා ගත් එස්.ජී.ප්‍රජිවන් මහතාට මාසිකව රු.60,000 ක මුදලක් ගෙවා ඇති අතර, එම බඳවා ගැනීම සඳහා 2019.06.03 දින අංක 5/2 දරන අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගෙන ඇත. | වැඩ පැවරීමක් හා කරන ලද කාර්යයන් පිළිබඳ විස්තරයක් අදාළ වවුචර් සමග ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) 2020.09.08 දින පවත්වා තිබුණු අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට අදාළ තීරණ හා අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර්තාව විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | පිළිගනිමි.<br>අදාළ රැස්වීම් වාර්තා නොමැත. | අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර්තාව විගණනයට ඉදිරිපත් කළ යුතුය. |

**1.5 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| විගණන නිරීක්ෂණය | | | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | නීති, රීති , රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | | |
| (අ) | මු.රෙ.1645(අ) | WP KD – 4194 අංක දරන රථයේ වාහන ලොග් පොත ක්‍රමවත්ව හා විධිමත් ලෙස සම්පූර්ණ කර සටහන් තබා නොතිබුණි. | අදාළ දිනට ලබා දෙන ලෙස රියදුරු දැනුවත් කර ඇත. තාවකාලික පදනම මත අධිකාරිය වෙත ලබා දී ඇති වාහනය සඳහා ලබා දී ඇති ලොග් සටහන් පොත අමාත්‍යාංශයේ ප්‍රවාහන නිලධාරියා විසින් යාවත්කාලීන කර ඇත. | ලොග් පොත් ක්‍රමවත්ව හා විධිමත් ලෙස සම්පූර්ණ කළ යුතුය. |
| (ආ) | මු.රෙ.1645 (ආ) සහ (ඇ) හා මු.රෙ.1646 | දෛනික ධාවන සටහන අනුව මාසික සාරාංශ සටහන් සෑම මසක් අවසන් වීමෙන් පසු ඊළඟ මාසයේ 15 දිනට පෙර විගණකාධිපති වෙත එවිය යුතු වුවත් භාවිතා කරනු ලබන වාහන දෙකක් සම්බන්ධයෙන් එසේ යොමු කර නොතිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | මාසික සාරාංශ සටහන් විගණකාධිපති වෙත එවිය යුතුය. |

**2.** **මෙහෙයුම් සමාලෝචනය**

**2.**1 **කළමනාකරණ අකාර්යක්ෂමතා.**

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| 2014 පෙබරවාරි 17 දිනැති 01/2014 දරන මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛය ප්‍රකාරව අධිකාරියේ කළමනාකරණ තීරණ ගැනීම් සම්බන්ධයෙන් අවම වශයෙන් මාසයකට එක් වරක් හෝ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පැවැත්විය යුතු වුවත් , 2019 වර්ෂය තුළදී රැස්වීම් 10ක් ද, 2020 වර්ෂයේදී එක් රැස්වීමක් ද 2021 වර්ෂයේදී රැස්වීම් දෙකක් ද හා 2022 නොවැම්බර් 30 දින දක්වා රැස්වීම් 05 පමණක් පවත්වා තිබුණි. | පිළිගනිමි. ඒ අනුව ආයතනයේ ප්‍රතිපාදන වෙන්වීම සැලකිල්ලට ගෙන අත්‍යවශ්‍ය අධ්‍යක්ෂ මණ්ඩල තීරණ ලබා ගැනීම සඳහා අත්‍යවශ්‍ය රැස්වීම් පමණක් තබා ඇත. | චක්‍රලේඛය ප්‍රකාරව අවම වශයෙන් මාසයකට එක් වරක් හෝ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පැවැත්විය යුතුය. |

**2.2** **මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| (අ) 2018 ඔක්තෝම්බර් මස 04 දිනැති 2018 අංක 32 දරන පාර්ලිමේන්තු පනත මගින් වැව්ලි කලාපය සඳහා වූ නව ගම්මාන සංවර්ධන අධිකාරිය පිහිටුවා ඇති අතර පනතේ 6 වන වගන්තිය අනුව අධිකාරිය විසින් ඉටු කළ යුතු පහත සඳහන් කාර්යයන් ආවරණය වන පරිදි ආයතනයේ ක්‍රියාකාරකම් හා කටයුතු සැලසුම් කළ යුතු වුවත් එසේ කටයුතු කර නොතිබුණි.<br><br>(i) අමාත්‍යවරයා විමසා, නම්කළ ප්‍රදේශවල නව ගම්මාන සංවර්ධනය කිරීම සඳහා ආණ්ඩුවේ සැලසුම්, වැඩසටහන් හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.<br><br>(ii) අධිකාරියේ අරමුණු ඉටුකිරීම උදෙසා ක්‍රියා කිරීමේදී වැව්ලි කලාපයේ අනෙකුත් ජාතික, ප්‍රාදේශීය සහ දිස්ත්‍රික් මට්ටමේ ක්‍රියාත්මක කිරීමේ නියෝජිත ආයතන සමග සම්බන්ධීකරණය කිරීම.<br><br>(iii) නව ගම්මාන සංවර්ධනය සඳහා වූ ආණ්ඩුවේ සැලසුම්, වැඩසටහන් සහ ව්‍යාපෘති සෑදීමේදී සහ නම්කළ ප්‍රදේශවල ක්‍රියාත්මක කිරීමේදී වැව්ලි කලාපයේ ප්‍රජා මූල සංවිධානවල සහභාගීත්වය සහතික කිරීම.<br><br>(iv) නම්කළ ප්‍රදේශවල වතුවල ඇති නිවාසවල නීත්‍යානුකූල පදිංචිකරුවන්ට එම නිවාසවල අයිතිය ප්‍රදානය කිරීම සඳහා, එම පදිංචිකරුවන්ට හිමිකම් ඔප්පු නිකුත්කිරීම පහසු කරලීම.<br><br>(v) නම්කළ ප්‍රදේශ වල වතු අංශයේ සිටින තරුණ ප්‍රජාවට ඔවුන්ගේ අධ්‍යාපනික සංවර්ධනය සඳහා තෘතියික හා උසස් අධ්‍යාපන ආයතන වලට ඇතුළත්වීම සඳහා සහාය සැලසීම. | 2021-2025 සංයුක්ත සැලැස්ම ඉහත ක්‍රියාකාරකම් ආවරණය වන පරිදි සකස් කර ඇත. | පනත අනුව ක්‍රියාකාර කම් හා කටයුතු සැලැසුම් කළ යුතුය. |

(vi) නම්කළ ප්‍රදේශවල ප්‍රජාවට අත්‍යාවශ්‍ය සේවා සැපයීම පහසු කරලීම සඳහා පළාත් සභා අමාත්‍යාංශ හා අනෙකුත් රාජ්‍ය අමාත්‍යාංශ වල ප්‍රාදේශීය මට්ටමේ කාර්යාල සමග කටයුතු කිරීම.

(vii) නම්කළ ප්‍රදේශවල වතු ප්‍රජාව සඳහා විකල්ප ජීවනෝපාය අවස්ථා ප්‍රවර්ධනය කිරීම හා ඒ සම්බන්ධයෙන් අවශ්‍ය මගපෙන්වීම් හා යෙදවුම් සැපයීම.

(viii) තම ජීවනෝපාය මාර්ග නගා සිටුවීම සඳහා කාන්තාවන්, ළමුන්, වැඩිහිටයන් හා විශේෂ අවශ්‍යතා ඇති පුද්ගලයන්ද ඇතුළු වන අංශයේ විවිධ ප්‍රජා කණ්ඩායම් සවි බල ගැනීවීම.

(ix) නම්කළ ප්‍රදේශවල වතුවල පිහිටි නිවාසවල නීත්‍යානුකූල පදිංචිකරුවන්ගෙන් පැවතෙන්නන්ටද එම නීත්‍යානුකූල පදිංචිකරුවන් විසින් භුක්තිවිදිනු ලබන සියලු පහසුකම් සලසනු ලබන බවට තහවුරු කිරීම.

(x) නම්කළ ප්‍රදේශවල භූමි සහ ජල මූලාශ්‍රවල භෞතික පහත වැටීම අවම කිරීමේ සහ පරිසර දූෂණය තුරන් කිරීමේ ද අරමුණින් නිවාරක සහ ප්‍රතිකර්මීය යන දෙයාකාරයෙන්ම වූ සංරක්ෂණ පියවර සියලු මට්ටම් වලදී ශන්තිමත් කිරීම.

(xi) ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය හා ව්‍යසන කළමනාකරණ මධ්‍යස්ථානය විමසා, නම්කළ ප්‍රදේශවල උවදුරු සහිත ප්‍රදේශ හඳුනාගැනීම සහ නේවාසික කාර්ය සඳහා නීති විරෝධි ලෙස පදිංචිවීවලින් ආරක්ෂා කර ගනිමින් ඒවා විකල්ප ඵලදායී භාවිතයට හැරවීම.

(xii) නම්කළ ප්‍රදේශවල ප්‍රමාණවත් සමාජ සේවා සහ ප්‍රමාණවත් තිරසාර යටිතල පහසුකම් සැලසීම ප්‍රවර්ධනය කිරීම.

| | | |
|---|---|---|
| (ආ) අධිකාරිය ආරම්භ කරන ලද 2019 වර්ෂයේ මාර්තු සිට විගණන දින වූ 2022.12.31 දින දක්වා වර්ෂ 03 කට අධික කාලයක් ආයතනය පවත්වාගෙන ගොස් ඇතත් එම සමස්ත කාලය තුළදී, රජයේ වියදමින් හා විදේශ ප්‍රදාන යටතේ ඉදිකර තිබුණු නිවාස 1000 කට අදාළ ඔප්පු ප්‍රතිලාභීන් වෙත පිරිනැමීමේ මූලික අදියර යටතේ ඔප්පු 375 ක් පිරිනැමීමේ වැඩසටහනේ මූලික කටයුතු ඉටුකර පිරිනැමිය හැකි ඔප්පු 300 කට ආසන්න ප්‍රමාණයක වැඩ සම්පූර්ණ කර ආයතනයට ලබා ගැනීමත්, සංවර්ධන ව්‍යාපෘති යටතේ ඇස්තමේන්තුගත වටිනාකම රු.3,968,304 ක් වූ මාර්ග කොන්ක්‍රිට් ඇතිරීමේ ව්‍යාපෘති 08 ක් පමණක් සම්පූර්ණ කිරීමක් සිදුකර තිබුණි.<br><br>තව ද 2019, 2020, 2021 හා 2022 වර්ෂ සඳහා අධිකාරිය විසින් දරන ලද සමස්ත පුනරාවර්තන වියදම් පිළිවෙළින් රු 2,318,382 ක් රු 1,891,480ක් රු 3,286,774ක් හා රු 8,145,340 ක් විය. 2019, 2020 හා 2022 වර්ෂ සඳහා අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වියදම් ලෙස පිළිවෙලින් රු 470,000 ක් රු .53,815ක් හා | පිළිතුරු ලබා දී නොමැත. | කාර්යක්ෂමතාවය ඉහළ නැංවීමට කටයුතු කළ යුතුය. |

331,759ක් වැය කර තිබුණි.සමස්ත පුනරාවර්තන වියදමින් වැටුප් හා දීමනා සඳහා 2019, 2020, 2021 හා 2022 වර්ෂ සඳහා පිළිවෙලින් රු. 1,839,842 ක් හෙවත් සියයට 79 ක් ද රු. 1,817,088 ක් හෙවත් සියයට 96 ක් ද රු. 3,109,592 ක් හෙවත් සියයට 95 ක්ද හා රු.6,040,648 ක් හෙවත් සියයට 74 ක්ද වශයෙන් සමස්ත වැටුප් හා දීමනා සඳහා 12,807,170 ක් ගෙවා තිබුණි.

## 2.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වතු නිවාස සහ ප්‍රජා යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්ගේ 2021 සැප්තැම්බර් 22 දිනැති අංක MCEEID/2/STMF/2020/2/temporary දරන පත්වීම් ලිපිය ප්‍රකාරව රේඛීය අමාත්‍යාංශයේ ලේකම් විසින් අධිකාරියේ අධ්‍යක්ෂ තනතුරේ රාජකාරි ආවරණය සඳහා සෞම්‍යමූර්ති තොන්ඩමන් අනුස්මරණ පදනමේ නියෝජ්‍ය අධ්‍යක්ෂ (පාලන) තනතුරේ සේවය කරනු ලබන නිලධාරියාව මාස 03 ක කාලයක් සඳහා එනම් 2021.09.21 දින සිට මෙම අධිකාරියේ අධ්‍යක්ෂ පාලන තනතුරට පත් කර තිබුණි. එම කාලය අවසානයේ සේවා දිගුවන් ලබා දෙන්නේ නම් අදාළ පත්කිරීම් බලධාරියා වන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ලබා දිය යුතු වුවත් අවස්ථා දෙකකදී මාස 06 බැගින් කාල පරිච්ඡේද දෙකක් සඳහා සේවා දිගුවන් අධිකාරියේ සභාපති විසින් ලබා දී තිබුණි. එසේම පත්වීම් ලිපිය ප්‍රකාරව එම තනතුරේ රාජකාරී ආවරණය කිරීම වෙනුවෙන් කිසිදු පාරිශ්‍රමිකයක් ලැබීමට හිමිකම් නොමැති බව දක්වා ඇති නමුත් එම ලිපියේ කොන්දේසි වලට පටහැනි ලෙස මෙම රාජකාරී ආවරණය කිරීම වෙනුවෙන් මෙම නිලධාරියා හට 2022 පෙබරවාරි දින සිට 2022 දෙසැම්බර් දක්වා රු. 220,811 ක් ගෙවා තිබුණි. | අධිකාරිය විසින් එම නිලධාරියා අධිකාරියේ උක්ත තනතුරට වැඩබලන පදනම මත බඳවා ගැනීමට 2022.02.11 අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබාගෙන ඇත. ඒ අනුව, සේවා දිගුවක් ලබාදීම හා වැටුප් ගෙවීම සිදුකර ඇත්තේ එම වැඩබැලීමේ පදනම මත සිදු කළ පත්වීම වෙනුවෙනි. එම නිසා පෙබරවාරි සිට ගෙවීම් සිදු කර ඇත. | සේවා දිගුවක් ලබා දීම සඳහා අධ්‍යෂ මණ්ඩල අනුමැතියක් ඇති බව දක්වා තිබුනද එම තිරණය විගණනයට ඉදිරිපත් නොවුණු නිසා නොපමාව එය ඉදිරිපත් කළ යුතුය. |

## 2.4 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 (ආ) වගන්තිය අනුව අධිකාරිය විසින් අවම වශයෙන් වසර තුනක කාලයක් සඳහා ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම සකස් කළ යුතු අතර ඉන්පසු එලඹෙන වර්ෂය සඳහා වූ ප්‍රසම්පාදන කටයුතු සඳහා විස්තරාත්මක කරුණු ඇතුළත්ව පිළියෙල කළ යුතුය. මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.3 ඡේදය අනුව ප්‍රසම්පාදන කාල සටහනක් සකසා නිසි කළමණාකරනයක්ද සිදුකළ යුතු වුවත් එවැනි ප්‍රසම්පාදන සැලැස්මක් හා කාල සටහනක් අධිකාරිය විසින් 2019, 2020 හා 2021 වර්ෂයන් වෙනුවෙන් සකස් කර නොතිබුණි. | පිළිගනිමි. 2022 වර්ෂයේ සිට නිවැරදි කිරීමට කටයුතු කර ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව ප්‍රසම්පාදන සැලැස්මක් හා ප්‍රසම්පාදන කාල සටහනක් සකස් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ලැප්ටොප් පරිගණක 03 මිලදී ගැනීමට අදාළව තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් 2020 දෙසැම්බර් 18 දින ඇගයීම් කර තිබූ පිරිවිතරයේත්, තවත් ලැප්ටොප් පරිගණකයක් මිලදී ගැනීමට අදාළව තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් එදිනම ඇගයීම් කර තිබූ පිරිවිතරයේත් එකම අවශ්‍යතා දක්වා තිබුණි. 2020 නොවැම්බර් 28 ලැප්ටොප් පරිගණක 03 ක් මිලදී ගැනීම සඳහා හා එදිනම තවත් ලැප්ටොප් පරිගණකයක් මිලදී ගැනීම යන අවස්ථා දෙකෙහිම එකම ආයතන 03 ක් ලංසු ඉදිරිපත් කර තිබුණු අතර එම ආයතන විසින් අවස්ථා දෙකෙහිදී ඉදිරිපත් කර තිබූ මිල ගණන් එකිනෙකට අසමාන විය. ලැප්ටොප් පරිගණකයක් මිලදී ගැනීමේදී අවම ලංසු ඉදිරිපත් කර තිබූ පෞද්ගලික සැපයුම්කරු වෙතින් රු. 121,464 කට එක් පරිගණකයක් මිලදී ගෙන තවත් ලැප්ටොප් පරිගණක 03 ක් එකක් රු. 190,000 බැගින් රු. 570,000 කට මිලදී ගෙන තිබුණි. | ඉහත මිලදී ගැනීම් අවස්ථා 02 ක දී සිදු වී ඇති බව පිළි ගනිමි. ලැප්ටොප් පරිගණක 02 හි පිරිවිතර සමාන නොවේ. අවස්ථා 02 හී දී වගකීම් කාලය අනුව පිරිවිතර වෙනස් වී ඇත.<br>වගකීම් කාලය අවු. 02 ලැප්ටොප් පරිගණක රු. 121,464/-<br>වගකීම් කාලය අවු. 03 ලැප්ටොප් පරිගණකය රු.190,000/-<br>එම නිසා අවස්ථා 02 ක දී නොව එකවර මිලදී ගැනීම සිදු කළ ද ඉහත ගෙවීම සිදු කළ යුතුවේ. මෙම ලැප්ටොප් මිලදී ගැනීමේදී රු.205,608 මුදලක් වැඩිපුර ගෙවා නොමැත. පිරිවිතර වෙනස මත ප්‍රසම්පාදන තීරණය ගෙන ඇත. | ලැප්ටොප් පරිගණකය 03 ක් මිලදී ගැනීම සඳහා ඉදිරිපත් කළ පිරිවිතර වල වගකීම් කාලය අවු. 03 දක්වා නොමැත. එවැනි පිරිවිතර යක් ඇති නම් නොපමාව එය ඉදිරිපත් කළ යුතුය. |

## 2.5 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අංක DMS/1849 දරන 2019.08.15 දිනැති කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කර ඇති, බඳවා ගැනීමේ කාර්ය පටිපාටියකට අනුව බඳවාගැනීම සිදුකළ යුතු වුවත් එසේ කටයුතු කිරීමකින් තොරව ආයතනයේ ස්ථිර තනතුරු සඳහා කොන්ත්‍රාත් පදනම යටතේ නිලධාරීන් බඳවා ගැනීම සිදුකර 2022 නොවැම්බර් 30 දින වන විටත් කොන්ත්‍රාත් කාලය දීර්ඝ කරමින් ආයතනය තුළ රඳවාගෙන තිබුණි. ප්‍රාදේශීය අධ්‍යක්ෂ ,සහකාර/නියෝජ්‍ය අධ්‍යක්ෂ, පරිපාලන නිලධාරි, කාර්යාල කාර්ය සහායක සහ රියදුරු යන තනතුරු සඳහා ස්ථිර නිලධාරීන් වෙනුවට කොන්ත්‍රාත් පදනම යටතේ නිලධාරීන් 7 දෙනෙකු බඳවාගෙන මාස 6න් 6ට කාලය දීර්ඝ කරමින් ආයතනය තුළ රඳවාගෙන තිබුණි. | අධිකාරිය විසින් කොන්ත්‍රාත් පදනම මත කාර්යය මණ්ඩලය බඳවා ගැනිම සිදු කර ඇත්තේ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියක් යටතේ ස්ථිර කාර්යය මණ්ඩලයක් බඳවා ගැනිමේ ක්‍රියාකාරකම් ඉටු කිරිම සඳහා කාර්යය මණ්ඩලයක් පැවතීමේ අවශ්‍යතාවය මත හා එතෙක් අධිකාරියේ මෙහෙයුම් කාර්යභාරය ඉටු කිරිම සඳහාය. කොන්ත්‍රාත් පදනම මත නිලධාරීන් දිගින් දිගටම පවත්වා ගැනීමට සිදුවී ඇත්තේ ස්ථිර නිලධාරීන් බඳවා ගැනීමට හැකියාවක් නොලැබීම හේතුවෙනි. | අනුමත කර ඇති තනතුරු සඳහා ස්ථිර නිලධාරීන් බඳවා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | වැඩබැලීමේ කාලය අවසානයේ සේවා දිගුවන් ලබා දෙන්නේ නම් අදාළ සේවා දිගුව පත්වීම් බලධාරියා වන අධ්‍යක්ෂ මන්ඩලය විසින් ලබා දිය යුතු වුවත් අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්, සංවර්ධන නිලධාරි, අධ්‍යක්ෂ යන තනතුරු වල නිලධාරීන් සඳහා කාල දිගුව සභාපති විසින් ලබා දී තිබුණි. | එම පත්වීමේ ලිපියේ සේවය අවසන් වන දිනය සටහන් කර නොමැතිව පෙර පත්වීම දීර්ඝ කිරීමක් සඳහා පත්වීම් බලධරයාගේ සේවා ලිපියක් අවශ්‍ය නොවේ. ඒ අනුව සභාපති විසින් ලබාදී ඇති සේවා දිගුව එම නිලධාරීන් හට අදාළ නොවේ. | සේවා දිගුව පත්වීම් බලධාරියා වන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ලබා දිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | අනුමත තනතුරු වෙනුවෙන් කිසියම් නිලධාරියෙකු කොන්ත්‍රාත් පදනම යටතේ පත්කර ඇති අවස්ථාවකදී එම කොන්ත්‍රාත් කාලය අවසන් වීමෙන් පසු කාල දිගුවක් ලබාදීමේදී පත්වීම් බලධාරියාගේ අනුමැතිය යටතේ ලබාදිය යුතු වුවත් නියෝජ්‍ය අධ්‍යක්ෂ 2020 නොවැම්බර් 01 බඳවාගෙන 2022 දෙසැම්බර් 31 දක්වා අවස්ථා 04කදීත්, පරිපාලන නිලධාරි 2021 ජූලි 01 බඳවාගෙන 2022 දෙසැම්බර් 31 දක්වා අවස්ථා 03කදීත්, රියදුරුවරයෙකු 2020 නොවැම්බර් 19 බඳවාගෙන 2022 දෙසැම්බර් 31 දක්වා අවස්ථා 04කදීත්, තවත් රියදුරුවරයෙකු 2021 ජුනි 01 බඳවාගෙන 2022 දෙසැම්බර් 31 දක්වා අවස්ථා 03කදීත්, කාර්යාල කාර්ය සහායක 2021ජූලි 01 බඳවාගෙන 2022 දෙසැම්බර්.31 දක්වා අවස්ථා 03කදීත් අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවට සභාපති විසින් සේවා දිගු ලබා දී තිබුණි. | මෙම නිලධාරීන් බඳවාගැනීම් අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය යටතේ සිදු කර ඇත. ඒ අනුව, පත්වීම් ලිපි නිකුත් කිරීම හා සේවා දිගුවන් ලබාදීම 2021.10.14 හා 2022.06.23 දිනයන්හිදි පැවැති අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය යටතේ සභාපති විසින් සිදුකර ඇත. | සේවා දිගුවක් ලබා දීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ඇති බව දක්වා තිබුණ ද එම තිරණය විගණනයට ඉදිරිපත් නොවුණු නිසා නොපමාව එය ඉදිරිපත් කළ යුතුය. |
| (ඈ) | අංක 13/21 දරන 2021 ඔක්තෝම්බර් 12 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල තීරණය අනුව ආයතනයේ පරිපාලන නිලධාරි, කළමණාකාර සහකාර හා කාර්යාල කාර්යය සහායක යන තනතුරු සඳහා නිලධාරීන් තිදෙනෙකු 2021 ජූලි 01 දින දී කොන්ත්‍රාත් පදනම යටතේ බඳවාගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා දී තිබුණ ද ඊට අදාළ පත්වීම් ලිපි පරීක්ෂාවේදී පරිපාලන නිලධාරිගේ සහ කාර්යාල කාර්ය සහායක නිලධාරියාගේ පත්වීම් ලිපි 2021 ජුනි 18 දින එනම් අදාළ පත්වීම් අනුමත කිරීමට පෙර නිකුත් කර තිබුණි. රියදුරු නිලධාරියෙකු කොන්ත්‍රාත් පදනම යටතේ බඳවාගැනීම සඳහා 2021 ජුනි 01 දින අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා දී තිබුණ ද පත්වීම් ලිපිය 2021 මැයි 21 දින එනම් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියට පෙර නිකුත් කර තිබුණි. | අදහස් දක්වා නොමැත. | අධ්‍යක්ෂ මණ්ඩලය අනුමැතිය ලබාදුන් දිනයන්ගෙන් පසු පත්වීම් ලිපි ලබාදිය යුතුය. |
| (ඉ) | අධිකාරියේ සහකාර/නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුර සඳහා අයදුම්කරුවන් 12 දෙනෙකු 2021 ජූලි 16 දින සම්මුඛ පරීක්ෂණයට කැඳවා තිබුණු අතර අනුමත බඳවා ගැනීමේ කාර්ය පරිපාටිය අනුව ව්‍යාපාර පරිපාලන ,රාජ්‍ය පරිපාලන , මානව සම්පත් කළමනාකරණ සහ වානිජ්‍ය යන විෂයන්ට අදාළ මූලික උපාධිය සහ මූලික උපාධියෙන් පසු කළමනාකරණ මට්ටමේ වසරක අවම සේවා පළපුරුද්දක් හෝ වෘත්තීය වරලත් ගණකාධිකාරි ආයතනයක අන්තර් මධ්‍යම විභාගය සමත් විම සහ ඉන් පසු කළමනාකරණ මට්ටමේ වසරක අවම සේවා පළපුරුද්දක් තිබිය යුතු නමුත් එම සුදුසුකම් නොමැති අයදුම්කරුවන් තිදෙනෙකු සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවා තිබුණි. මෙම තනතුරට සුදුසු පළමු නිලධාරියා ලෙස තෝරා තිබූ අයදුම්කරුහට ඉහත දැක්වූ උපාධි යටතට නොවැටෙන විවෘත විශ්ව විද්‍යාලයේ නීතිවේදී උපාධියක් හා රක්ෂණ හා තක්සේරුකරණය සම්බන්ධ විද්‍යාවේදී උපාධියක් හිමිවී තිබුණි. දෙවන සහ සිව්වන නිලධාරීයා ලෙස තෝරා තිබූ අයදුම්කරුවන් උපාධිය අවසන් වීමෙන් පසු කළමනාකරණ මට්ටමේ වසරක අවම සේවා පළපුරුද්දක් සම්පූර්ණ කර නොතිබුණි.<br>තවද සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් දෙවන නිලධාරීයා | එම විගණන විමසුමේ සඳහන් කර ඇති සහකාර අධ්‍යක්ෂ අධිකාරියේ කොන්ත්‍රාත් පදනම මත සේවයට බඳවා ගැනීම ස්ථිර පත්වීම් සඳහා කැඳවීම් සිදු කිරීමට පෙර සිට සිදු කර ඇත. බඳවාගැනීමේ පටිපාටිය අනුව අවශ්‍ය අවම සුදුසුකම වන්නේ කළමනාකරණ මට්ටමේ වසරක් අවම සේවා පලපුරුද්ද හා පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධියක් හදාරා තිබීම වේ. | අනුමත බඳවා ගැනීමේ කාර්ය පරිපාටිය අනුව මූලික අධ්‍යාපන සුදුසුකම් හා අවම සේවා පලපුරුද්දක් ඇති නිලධාරින් තෝරා ගත යුතුය. |

| | | |
|---|---|---|
| ලෙස තෝරා තිබූ අයදුම්කරු ඒ වන විට ද මෙම තනතුරට පළපුරුද්ද නොතිබියදී කොන්ත්‍රාත් පදනමට බඳවාගෙන තිබුණු අතර ඔහුට අනුමත වැටුප් පරිමාණයේම 2020 නොවැම්බර් 01 දින සිට විගණන දින වූ 2022 දෙසැම්බර් 31 දින දක්වාම කොන්ත්‍රාත් වැටුප් ලෙස රු.1,719,712 ගෙවා තිබුණි. | | |
| (ඊ) අධිකාරිය විසින් අනුමත තනතුරු සම්පූර්ණ කිරීමට කටයුතු කළ යුතු වුවත් 2019 සැප්තැම්බර් 12 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල සාකච්ඡා සටහන් අනුව 2021 පෙබරවාරි මස තනතුරු 12 ක් සඳහා අයදුම්පත් කැඳවා ඉන් අධ්‍යක්ෂ, සහකාර/නියෝජ්‍ය අධ්‍යක්ෂ හා ගණකාධිකාරී යන තනතුරු 03 ක් වෙනුවෙන් 2021 ජූලි මස සම්මුඛ පරීක්ෂණ පවත්වා තිබුණද මෙම බඳවා ගැනීම් සිදුකර නොතිබුණි. 2020 නොවැම්බර් සහකාර අධ්‍යක්ෂ හා රියදුරු තනතුරුත්, 2021 ජූලි පරිපාලන නිලධාරි හා කාර්යාල කාර්ය සහයක තනතුරුත්, 2021 ජූනි රියදුරු තනතුරකුත්, 2022 පෙබරවාරි සහකාර අධ්‍යක්ෂ (පාලන) හා රියදුරු තනතුරුත් වශයෙන් කොන්ත්‍රාත් පදනම යටතේ නිලධාරීන් 07 දෙනෙකු බඳවාගෙන තිබූ බවත් විවෘත ක්‍රමවේදයක් අනුව ඉහත සඳහන් අනුමත තනතුරු 07 ස්ථිර ලෙස සම්පූර්ණ කිරීමේ හැකියාව තිබුණ ද එසේ කටයුතු කර නොතිබූ බවත් නිරීක්ෂණය විය. | 2019- 2021 දක්වා අයදුම්පත් කැඳවීමට ගත වූ කාලය තුළ ස්ථිර බඳවාගැනීමට ගතවූ ප්‍රමාදය ආයතනයේ කළමනාකාරීත්වයේ දුර්වලතාවක් මත සිදුවූවක් නොවේ. එය බඳවා ගැනීමේ පටිපාටිය අනුමත වීමේ ප්‍රමාදය මත සිදු වී ඇත. බඳවා ගැනීමට අනුමැතිය 2020.11.17 දින ලැබී ඇත. 2021 වර්ෂය සඳහා අත්‍යවශ්‍ය කාර්යමණ්ඩලය බඳවා ගැනීමට ඉල්ලුම් පත් කැඳවා ඇත. 2021 වර්ෂයේදි බඳවා ගැනීමේ ක්‍රියාවලියට ප්‍රතිපාදන නොමැතිවීම නිසා බඳවාගැනීම සම්පූර්ණ කිරීමට නොහැකි විය. | විවෘත ක්‍රමවේදයක් අනුව අනුමත තනතුරු ස්ථිර ලෙස කඩිනමින් සම්පූර්ණ කිරීමට කටයුතු කළ යුතුය. |

**3. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**3.1 සංයුක්ත සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.3 වගන්තිය ප්‍රකාරව මුදල් වර්ෂය ආරම්භ වීමට දින 15 කට කලින් පිළියෙල කරන ලද සංයුක්ත සැලැස්මේ පිටපත් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කිරීමෙන් පසු යාවත්කාලීන කරන ලද අයවැය ලේඛන සමඟ රේඛීය අමාත්‍යාංශය, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තුමේන්තුව, මහා භාණ්ඩාගාරය සහ විගණකාධිපති දෙපාර්තුමේන්තුවට ඉදිරිපත් කළ යුතු නමුත් 2020 - 2024 සංයුක්ත සැලැස්ම පිළියෙල කර නොතිබුණි. 2021 නොවැම්බර් 16 දිනැති 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයට අනුව 2021-2025 උපාය මාර්ගික සංයුක්ත සැලැස්ම සමග ක්‍රියාකාරී සැලැස්ම සහ අයවැය ලේඛනය රේඛීය අමාත්‍යාංශය ලේකම් මගින් ලේකම්, මහා භාණ්ඩාගාරය සහ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තුමේන්තුවේ සහ රාජ්‍ය අයවැය දෙපාර්තුමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් ,මහා භාණ්ඩාගාරය වෙත 2022 දෙසැම්බර් 31 දින වන විටත් ඉදිරිපත්කර නොතිබුණි. | අධිකාරියේ කාර්ය මණ්ඩලය බඳවා ගැනීම් පටිපාටියට අනුමැතිය ලැබී ඇත්තේ 2020.11.17 වන දින වේ. එබැවින් ආයතනය සඳහා සංයුක්ත සැලැස්ම සකස් කිරීම 2021 වර්ෂයේ ආරම්භ කර ඇත. ඒ අනුව 2021-2025 වර්ෂයන් සඳහා සංයුක්ත සැලැස්ම පිළියෙල කර තිබූ අතර 2021.04.08 වන දින ඒ සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලැබී ඇත. | චක්‍රලේඛය ප්‍රකාරව මෙම සැලැසුම් ගිණුම් වර්ෂය ආරම්භ වීමට දින 15 කට පෙර ඉදිරිපත් කළ යුතුය. |

## 3.2 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2014 පෙබරවාරි 17 දිනැති අංක 1/2014 දරන මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ ලේකම් විසින් නිකුත්කරන ලද රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2019 හා 2020 වර්ෂයන් වෙනුවෙන් අධිකාරිය විසින් ආයතනයේ අරමුණු හා කාර්යයන් ආවරණය වන පරිදි ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණු අතර 2021 වර්ෂය වෙනුවෙන් පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැලැස්ම තුළ නව ගම්මාන සංවර්ධනය කිරීම සඳහා ආණ්ඩුවේ සැලසුම්, වැඩසටහන් හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ වතුවල ඇති නිවාස වල නීත්‍යානුකූල පදිංචිකරුවන්ට එම නිවාස වල අයිතිය ප්‍රදානය කිරීම සඳහා, එම පදිංචිකරුවන්ට හිමිකම් ඔප්පු නිකුත්කිරීම පහසු කරලීම යන කාර්යයන් හැර වෙනත් කිසිදු කාර්යයක් ආවරණය වන පරිදි 2021 වර්ෂයට ඉදිරිපත් කළ ක්‍රියාකාරී සැලැස්ම තුළ, හදුනාගෙන සැලසුම් කර නොතිබුණි.<br><br>තවද මෙම චක්‍රලේඛය 4 වගන්තිය අනුව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම තුළ ඇතුළත් විය යුතු පහත සඳහන් තොරතුරු ඇතුළත්ව නොතිබුණි.<br><br>(අ) අදාළ වර්ෂයට යාවත්කාලීන කළ ආයතනයේ සංවිධාන ව්‍යුහය, අනුමත කාර්ය මණ්ඩලය සහ දැනට සිටින කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර<br><br>(ආ) අදාළ වර්ෂය සඳහා අයවැය ලේඛනය<br><br>(ඇ) අදාළ වර්ෂය තුළ වාර්ෂික අයවැය පදනම් කරගත් ප්‍රමුඛතා අනුව සකස් කළ ක්‍රියාකාරී සැලැස්ම, ක්‍රියාත්මක කාල රාමුව හා එම ක්‍රියාකාරකම්වල අපේක්ෂිත නිමැවුම්/ප්‍රතිඵල<br><br>(ඈ) ප්‍රධාන ප්‍රසම්පාදනයන් සඳහා වන ප්‍රසම්පාදන සැලැස්ම<br><br>(ඉ) භාණ්ඩාගාර ප්‍රතිපාදන මත ක්‍රියාත්මක වන ව්‍යවසායන් සම්බන්ධයෙන් වාර්ෂික ක්‍රියාකාරකම් සඳහා වන අක්මුදල් අවශ්‍යතා සැලැස්ම<br><br>(ඊ) අභ්‍යන්තර විගණන සැලැස්ම | 2019 වර්ෂයේ සහ 2021 වර්ෂයේ නොවැම්බර් මස දක්වා අධිකාරියේ කාර්ය මණ්ඩල බඳවා ගැනිමේ පටිපාටිය අනුමතව නොතිබූ අතර කාර්ය මණ්ඩලයක් නොමැති විම නිසා 2019 සහ 2020 වර්ෂයන් සඳහා අධිකාරියේ මෙහෙයුම් කටයුතු සිදුවි නොමැත. 2021 වර්ෂයේ අධිකාරියේ සංවර්ධන කටයුතු සඳහා ප්‍රතිපාදන නොතිබිම මත අමාත්‍යාංශය විසින් වෙන් කරන ලද ප්‍රතිපාදන හා මූලික ප්‍රතිපාදන අවශ්‍ය නොවන කාර්යයන් පමණක් ඉලක්ක කර 2021 වර්ෂය සඳහා වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම සකස් කර ඇත. | චක්‍රලේඛය ප්‍රකාරව ක්‍රියාකාරී සැලැස්ම සකස් කළ යුතුය. |

### 3.3 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 වගන්තිය හා 2003 ජුනි 02 දිනැති අංක පීඊඞී/12 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය හා 2021 නොවැම්බර් 16 දිනැති 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයට අදාළව නිකුත්කරන ලද රාජ්‍ය ව්‍යාපාර සඳහා වූ යහපාලනය පිළිබඳ මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව අධිකාරියේ අභ්‍යන්තර විගණන අංශයක් ස්ථාපිත කර හෝ අභ්‍යන්තර විගණන කටයුතු අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශයට පවරා හෝ නොතිබීම නිසා අභ්‍යන්තර විගණන සැලසුම් සකස් කර ක්‍රියාත්මක කිරීම සිදුවී නොතිබුණි. | පිළිගනිමි. අභ්‍යන්තර විගණන කටයුතු අමාත්‍යාංශය හරහා සිදුකිරීමට 2023.01.30 දින පැවැති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දි තීරණය කළ අතර ඒ අනුව අධිකාරියේ මෙහෙයුම් කටයුතු අධීක්ෂණය කිරීමට අභ්‍යත්තර විගණන අංශය හරහා සිදු කිරීමට අමාත්‍යාංශය වෙතින් ඉල්ලීම් කර ඇත. | අභ්‍යන්තර විගණන අංශයක් ස්ථාපිත කිරීම මගින් හෝ එම කටයුතු අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශය විසින් කළ යුතුය. |
| (ආ) අධිකාරියේ අභ්‍යන්තර විගණන කටයුතු සිදුකිරීම සඳහා වතු නිවාස හා ප්‍රජා යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යාංශය වෙත පවරා ඇති බවට දක්වා තිබුණද ඒ සම්බන්ධයෙන් අදාළ තීරණ ඇතුළත් අධ්‍යක්ෂ මණ්ඩල තීරණය ද, අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශය විසින් අධිකාරියේ විගණන කටයුතු සිදු කර නිකුත් කරන ලද අභ්‍යන්තර විගණන විමසුම් කිසිවක් ද විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | පිළිගනිමි. අභ්‍යන්තර විගණන කටයුතු අමාත්‍යාංශය හරහා සිදුකිරීමට 2023.01.30 දින පැවැති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දි තීරණය කළ අතර ඒ අනුව අධිකාරියේ මෙහෙයුම් කටයුතු අධීක්ෂණය කිරීමට අභ්‍යත්තර විගණන අංශය හරහා සිදු කිරීමට අමාත්‍යාංශය වෙතින් ඉල්ලීම් කර ඇත. | අධ්‍යක්ෂ මණ්ඩල තීරණය සහ අභ්‍යන්තර විගණන විමසුම් ඉදිරිපත් කළ යුතුය. |

### 3.4 විගණන කමිටු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2003 ජුනි 02 දිනැති පීඊඞී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 7.4.1 පරිදි ප්‍රකාරව සෑම මාස තුනකට වරක් එනම් වසරකට සිව් වතාවක් විගණන හා කළමණාකරණ කමිටු රැස්වීම් පැවැත්වීම සිදු කළ යුතු වුවද, 2019, 2020 හා 2021 යන වර්ෂ අවසාන වන විටත් කිසිදු රැස්වීමක් පැවත්විමට අධිකාරිය අපොහොසත් වී තිබුණි. | අධිකාරියේ අභ්‍යන්තර විගණක කටයුතු අධික්ෂණය සඳහා අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණක අංශය වෙත යොමු කර ඇත.<br>අභන්තර විගණක අංශය වෙතින් වරින් වර පරීක්ෂා කර ඇත. ඉහතින් දක්වා ඇති පරිදි අමාත්‍යාංශ අභ්‍යන්තර විගණනයට යොමුකර ඇත. | චක්‍රලේඛය අනුව සෑම මාස තුනකට වරක් විගණන හා කළමණාකරණ කමිටු රැස්වීම් පැවැත්වීමට කටයුතු කළ යුතුය. |

### 3.5 අයවැය ලේඛනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.2.4 ප්‍රකාරව මූල්‍ය වර්ෂය ආරම්භ වීමට තෙමසකට පෙර කෙටුම්පත් අයවැයක් අනුමැතිය ලබාදීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතු වුවද, අධිකාරිය විසින් 2020 හා 2021 වර්ෂයන් වෙනුවෙන් එසේ කටයුතු කර නොමැති බව විගණනයට නිරීක්ෂණය විය. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. | චක්‍රලේඛය ප්‍රකාරව මූල්‍ය වර්ෂය ආරම්භ වීමට තෙමසකට පෙර කෙටුම්පත් අයවැය අධ්‍යක්ෂ මණ්ඩලය අනුමැතිය ලබා ගත යුතුය. |

### 3.6 තිරසාර සංවර්ධන අරමුණු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් 2030 වන විට සිය සංවිධානයට අයත් සියලුම රටවල ආර්ථික වර්ධනය සහ සමාජීය සංවර්ධනය හා පාරිසරික ආරක්ෂාව සැලසීම පදනම් කර ගනිමින් තිරසාර සංවර්ධන න්‍යාය පත්‍රය හඳුන්වා දී තිබුණද, ඊට ගැලපෙන පරිදි අපේක්ෂිත අරමුණු, ඉලක්ක හා දර්ශක හඳුනා ගෙන නොතිබුණු අතර නිවැරදි දත්ත ලබාගැනීමේ සහ භෞතික සම්පත් කළමනාකරණය කිරීමේ ක්‍රමවේදයන් ද, හඳුනාගෙන නොතිබුණි | තිරසර සංවර්ධන 17 අදාළව ශ්‍රී ලංකාව අත්පත් කර ගැනීමට අපේක්ෂිත ඉලක්ක හෝ එම දත්ත (baseline data) මේ දක්වා ප්‍රකාශයට පත් කොට නොමැත. ඊට අදාළ ජාතික සැලසුමක් හෝ උපාය මාර්ගික සැලැස්මක් හෝ මෙම ආයතන වෙත ලබා දී නොමැත. එබැවින් ආයතනයට අදාළව ඉලක්ක හෝ දර්ශක හඳුනා ගැනීම හැකියාවක් නොමැති බැවින් මේ දක්වා එසේ සිදු කර නොමැත. ඉදිරියේදී ඉලක්ක සකස් කිරීම සඳහා, පවතින වර්තමාන තත්ත්වය පිළිබඳ දත්ත ලබා ගැනීම පිණිස දත්ත සමීක්ෂණයක් සිදු කිරීමට කටයුතු කරනු ලැබේ. | තිරසාර සංවර්ධන න්‍යාය පත්‍රයට ගැළපෙන පරිදි අපේක්ෂිත අරමුණු, ඉලක්ක හා දර්ශක හඳුනා ගත යුතුය. |